# "ළමා ලෝකයයි - වැඩිහිටි වියයි" පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා උපදෙස් මාලාව - 2025

- **හැඳින්වීම :-**

විස්තෘත පවුල් ක්‍රමය න්‍යෂ්ටික පවුල දක්වා විකාශන වීමේ ප්‍රතිඵලයක් වශයෙන් දරුවන් හා වැඩිහිටියන් අතර අන්තර් සම්බන්ධතාවය බිඳවැටී ඇති අතර, සංකීර්ණ සමාජ ක්‍රමය තුළ වැඩිහිටි භාවය පිළිබඳ පාසල් මට්ටමින් දරුවන් දැනුවත් කිරීම අවශ්‍යය වේ. තවද දරුවන් වැඩිවියටපත් වීම හා දරුවන් විවාහ වීම තුල වෙන් වූ පවුල් සංස්ථාවක් ගොඩනැගේ. ඒ අනුව දෙමාපියන් හා දරුවන් අතර දේපළ බෙදී යෑම, දරුවන් විසින් දෙමාපියන් නඩත්තු කිරීම, දරුවන් විසින් වයස්ගත වූ දෙමාපියන් රැකබලා ගැනීම ආදී කරුණු වලදී විවිධ වූ ගැටළු මතු වේ. වැඩිහිටියන් මහා මඟට ඇද දැමීම, වැඩිහිටි නිවාස තුළට යොමු කිරීම ආදී තත්ත්වයන් උද්ගත වේ. මෙම තත්ත්වය නැති කිරීම හෝ අවම කිරිමේ හැකියාව ඇත්තේ පාසල් වියේදීම ඔවුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳ අවබෝධයක් ලබාදීම තුළින්ය.ඒ අනුව මෙම වැඩසටහන මූලික වශයෙන් වැඩිහිටියන් රැකබලා ගැනීම, වැඩිහිටියන්ට ගරුකිරීම, ඔවුන් පිළිබඳ යහපත් ආකල්ප දරුවන් තුළ ඇති කිරීම හා Clean Sri lanka රාජ්‍ය ප්‍රතිපත්තියේ සඳහන් සාරධර්ම රැක ගැනීමට යටත්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

**අරමුණු :-**

ගිලිහී යන සාරධර්ම හමුවේ දැයේ දූ දරුවන්ට වැඩිහිටියන් පිළිබඳ අවබෝධයක් ලබා දීමටත්, වැඩිහිටි භාවය පිළිබඳ යහපත් දැක්මක් හා ඔවුන් අතර අන්තර් සම්බන්ධතාවය ගොඩනැංවීමත් අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන දියත් කරනු ලබය

**වැඩසටහන් ක්‍රියාත්මක කිරීම -**

- දිස්ත්‍රික්කයක එක බැගින් සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.
- එක් වැඩසටහනක් සඳහා රු. 35,000.00 ක උපරිම මුදල දිස්ත්‍රික් ලේකම් මඟින් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දෙනු ලැබේ
- ඔබ විසින් 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන් අවම 100 ක් මෙම වැඩසටහන සඳහා සහභාගී කරවිය යුතු අතර, ඒ සඳහා පාසල්, දහම් පාසල් වල සිසුන් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.
- වැඩසටහන පැවැත්විය යුතු අවම කාලය පැය තුනක් වියයුතු අතර, ඒ සඳහා පහත සඳහන් මාතෘකාවලට අනුව සිදුකළ යුතුය
  - වැඩිහිටියා හා වැඩිහිටි භාවය පිළිබඳ සමාජ කථිකාවත - වැඩිහිටිවිය පිළිබඳව හඳුනා ගැනීම
  - වැඩිහිටිවියේ සෞඛ්‍ය හා රෝගී වැඩිහිටියන් රැකබලා ගැනීම - රෝගී වැඩිහිටියන් හා වයෝවෘද්ධ වැඩිහිටියන් රැකබලා ගැනීම.
  - වැඩිහිටියන් පිළිබඳව ළමා අපේ වගකීම. - පාසල් දරුවන් හා වැඩිහිටියාගේ අන්තර් සම්බන්ධතාවය වර්ධනය කිරීම.
- සම්පත් දායකයින් තෝරා ගැනීම පහත පරිදි සිදු කළ යුතුය
  - උක්ත මාතෘකා සඳහා දැනුම ඇති සුදුසු නිලධාරීන් තෝරා ගත යුතුයි.
  - මෙම වැඩසටහන සඳහා සම්පත් දායකයින් තෝරා ගැනිමේදී හා දීමනා ගෙවීමේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛන අංක 07/2025 හා 2025.03.17 අනුව කටයුතු සිදු කළ යුතුය.
- තෝරා ගත් පාසල් වලට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි විෂය භාර ක්ෂේත්‍ර නිලධාරි විසින් වැඩසටහන් සංවිධානය කළ යුතුය. [වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරි ( වැඩිහිටි ) /සමාජ සේවා නිලධාරි / සංවර්ධන නිලධාරි (සමාජ සේවා) ]

- වැඩසටහන සඳහා මුදල් ප්‍රතිපාදන යොමු කර මාස තුනක් ඇතුළත හෝ 2025.11.30 වන දිනට යන දින දෙකෙන් පළමු එළඹෙන දිනට ප්‍රථම පවත්වා අවසන් කළ යුතුය.

**අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම**

- මුදල් ලැබීම් කුවිතාන්සි පත (පොදු 172) මුදල් ලැබී දින 14 ක් ඇතුළත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.

- වැඩසටහන පවත්වා අවසන් වූ වහාම ඒ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිත සවිස්තර වාර්තාව NSE/DEV/9/I (ඇමුණුම 03) ආකෘතියට අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.